# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2015/45 - 2017 අප්‍රේල් මස 19 වැනි බදාදා - 2017.04.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින්, එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, එහි 21 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලබන, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, 2007 පෙබරවාරි 02 වන දින අංක 1482/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සහ 2014 ඔක්තෝබර් මස 20 වන දින අංක 1885/2 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ ''පීඨය'' යන ශීර්ෂය යටතේ දැක්වෙන ''ශාස්ත්‍ර පීඨය' යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වැනි තීරයේ ''අධ්‍යයන අංශ'' යන ශීර්ෂය යටතේ දැක්වෙන සියලුම අයිතම ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

| '' *I වන තීරය* <br> *පීඨය* | *II වන තීරය* <br> *අධ්‍යයන අංශ* |
|---|---|
| ශාස්ත්‍ර පීඨය | 1. අරාබි හා ඉස්ලාමීය සංස්කෘතික අංශය |
| | 2. පුරාවිද්‍යා අංශය |
| | 3. සම්භාව්‍ය භාෂා අංශය |
| | 4. ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අංශය |
| | 5. අධ්‍යාපන විද්‍යා අංශය |
| | 6. ඉංග්‍රීසි භාෂා අංශය |
| | 7. ලලිත කලා අංශය |
| | 8. භූගෝල විද්‍යා අංශය |
| | 9. ඉතිහාස අංශය |
| | 10. දේශපාලන විද්‍යා අංශය |
| | 11. පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය |
| | 12. දෙමළ භාෂා අංශය |

| " *I වන තීරය* *පීඨය* | *II වන තීරය* *අධ්‍යයන අංශ* |
|---|---|
| | 13. සිංහල භාෂා අංශය |
| | 14. සමාජ විද්‍යා අංශය |
| | 15. නීති අංශය |
| | 16. දර්ශන විද්‍යා අංශය |
| | 17. මනෝ විද්‍යා අංශය.". |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ දී ය.

05 - 92

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.